ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු දෘඩ පිටපත් ලෙස පවතින පිඹුරු අංකිතකරණය කිරීම (Digitization) සඳහා සුදුසුකම් ලත් අය තාවකාලික පදනම මත අනුයුක්ත කිරීම

ගිවිසුම - 2026

මෙහි මින්මතු "සේවා යෝජක" ලෙස හැඳින්වෙන කොළඹ 05, නාරාහේන්පිට, බර්නාඩ සොයිසා මාවත (කිරුළ පාර), අංක 150 දරණ ලිපිනයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සර්වේයර් ජනරාල් වෙනුවෙන් කටයුතු කරන ..... දිස්ත්‍රික්/අංශය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී එක් පක්ෂයකටත්, මෙහි මින්මතු කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු යන නාමයෙන් හැඳින්වෙන.....
.....(කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු ගේ ලිපිනය) දරණ ලිපිනයේ පදිංචි.....
(කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු ගේ නම) අනෙක් පක්ෂයටද ඇතුළත්ව එකී දෙපාර්ශවය අතර 2026 .....මස.....දින ..... හී දී ඇති කරගත් ගිවිසුමයි.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු දෘඩ පිටපත් පිඹුරු වල ඇති බිම් කැබලි මිලියන 3.5 ක් අංකිත දත්ත බවට පත් කිරීමට අදාළ වූ කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු ට පවරනු ලබන කැබලි අංකිතකරණය කිරීම, ගිවිසුම්කරු ලවා ඉටු කරවා ගැනීමට සේවායෝජකයා කැමැත්තක් දක්වන බැවින්ද, එම කාර්යය නිසි ප්‍රමිතියට අනුව ඉටු කිරීම, නිම කිරීම හා එහි සිදුවන යම් දෝෂයන් නිවැරදි කිරීම වෙනුවෙන් සේවායෝජකයා විසින් ගෙවීමට යෝජිත මිල ගණුන් සඳහා කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු සිය එකඟතාවය ලබා දී ඇති බැවින්ද එකී ගිවිසුම පහත පරිදි වේ.

01 මෙම ගිවිසුමේ වචන සහ ප්‍රකාශ පිළිවෙලින් මෙම ගිවිසුම මඟින් ඔවුන් වෙත පවරා දෙන කොන්ත්‍රාත් ලේඛනයේ එම වචන සඳහා දී ඇති අර්ථයම ගනු ලැබේ.

02 මෙහි පහත සඳහන් ලේඛන මෙම ගිවිසුම හා බැඳුනු හා ඒ හා එක්ව කියවිය යුතු එකී ගිවිසුමේම කොටස් ලෙස සලකනු ලැබේ.

i. මෙම ගිවිසුම් පත්‍රය
ii. කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රය
iii. ක්‍රියාත්මකව පවතින (දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි)
iv. උපදෙස්, කොන්දේසි සහ පිරිවිතර ලේඛන
v. සේවායෝජකයාගේ ප්‍රදානය කිරීමේ දැන්වීම
vi. කොන්ත්‍රාත්තුව භාරගැනීමේ ලිපිය
vii. පසු කාලීනව මේ සම්බන්ධයෙන් සිදුවන වෙනත් ඕනෑම ලිපි ගණුදෙනුවක්

03 එකිනෙකට අනුරූප සහ අන්‍යොන්‍ය පැහැදිලි කිරීම් වශයෙන් ඉහත කී ලේඛන සැලකිය යුතු වන අතර යම්කිසි ව්‍යාකූල හෝ විෂමතාවයක් ගොඩනැඟුනු අවස්ථාවක ඉහත 02 හි සඳහන් ලේඛනයන්හි ඇතුලත් කරුණු අනුව කටයුතු කරනු ලැබේ.

04 මෙම ගිවිසුමේ සහ එයට අමුණා ඇති ලේඛණයන්හි සඳහන් පරිදි කොන්ත්‍රාත්තුවේ වන සියළු විධිවිධාන වලට අනුකූලව කාර්ය ඉටු කිරීමට සහ සාර්ථකව නිම කිරීමට කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු සේවායෝජකයා සමග මින් ගිවිස ගනී.

05 මෙම ගිවිසුම අත්සන් කළ දින සිට වලංගු වේ.

06 කොන්ත්‍රාත්තුවේ විධිවිධාන පරිදි, කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු ගේ වැඩ සළකා බැලීමෙන් පසුව ඔහු වෙත ගෙවිය යුතු යම් මුදලක් වේ නම් එකී කොන්ත්‍රාත්තුවේ සඳහන් කාලයට සහ ආකාරයට අනුව එකී ගෙවීම සිදුකිරීමට සේවායෝජකයා මෙයින් එකඟ වේ.

07 අනුයුක්ත කර ඇති මිනින්දෝරු අධිකාරි විසින් නියම කරන දිනට අංකිතකරණය කළ යුතු ඉඩම් කැබලි වල වැඩ අවසන් කර එකී අංකිතකරණය කළ දත්ත මිනින්දෝරු අධිකාරිවරයා වෙත භාරදීමට කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු එකඟ වේ.

08. තමා විසින් අංකිතකරණය කළ දත්ත, දත්ත පද්ධතියට ඇතුලත් කෙරෙන තෙක් වූ කවර අවස්ථාවකදී හෝ හදුනාගන්නා සංශෝධනයන් අමතර ගාස්තු අයකිරීමකින් තොරව ඉටුකර දීමට කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු එකඟ වේ.

09. අංකිතකරණය කළ දත්ත, සම්පූර්ණ කර භාර දීම ප්‍රමාද වීම හේතුවෙන් වන්නාවූ ගෙවීම් හෝ ඊට අනුශාංගික කිසිදු අහිතකර ප්‍රතිඵලයක් සම්බන්ධයෙන් සේවායෝජකයා විසින් කිසිදු වගකීමක් භාර ගනු නොලැබේ.

10. කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු විසින් ඔහු මිය ගිය හොත් බිල්පතට අදාල ගෙවීම් කටයුතු සිදු කල යුතු ප්‍රතිලාභියා වන.....
(නම, හැඳුනුම්පත් අංකය සහ සම්බන්ධතාවය සඳහන් කරන්න) වෙත ගෙවීම් කල යුතුය.

කොන්ත්‍රාත්කරු /ගිවිසුම්කරු	සේවායෝජකයා
අත්සන.....	අත්සන.....
කොන්ත්‍රාත්කරු/ගිවිසුම්කරු ගේ නම	ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයාගේ නම .....
කොන්ත්‍රාත්කරු / ගිවිසුම්කරු ගේ ජා.හැ.අ	නිල මුද්‍රාව
මෙම ගිවිසුමට හේතුවන පාර්ශවයන්ගේ අත්සන් වෙනුවෙන් සාක්ෂි ලෙස ඉදිරිපිටදී අත්සන යොදන ලදී	
නම	නම .....
ජාතික හැඳුනුම්පත් අංකය	ජාතික හැඳුනුම්පත් අංකය
ලිපිනයන්	
.....	.....
.....	.....
.....	.....